IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

## මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලා අංක 09

## ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ 2019 නොවැම්බර්)

## DDAMS 1003 – මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්‍රමවේදය

උපදෙස්

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ තුනයි (03).

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් හෝ පිටුවක් මුද්‍රණය වී නොමැති නම් ඒ බව වහාම ශාලාධිපති වෙත දැනුම් දෙන්න.

01. ප්‍රශ්නය

සුසන්ත 25 හැවිරිදි තරුණයෙකි. වයස අවු.21 දී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ඔහු කිහිප අවස්ථාවක් පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලැබුවද මේ වනවිටත් සුවපත් වී නොමැත. පුනරුත්ථාපනය වී නිවසට පැමිණි පසු මාස කිහිපයක් සතුටින් කාලය ගත කළද ඔහු යලි යලිත් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම නිසා දැඩි කළකිරීමෙන් පසුවේ.

i. ඔබ මත්ද්‍රව්‍ය ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර සේවා සපයන උපදේශකවරයෙක් වශයෙන් සුසන්ත නැවත නැවතත් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට බලපෑ හැකි ක්‍රියාවලිය (Relapse Process) කෙටියෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 10)

ii. ඇබ්බැහිකාරීත්වය මැඩපවත්වා ගැනීමේ කුසලතා (Coping Skills on Addiction) දියුණු කර ගැනීම සඳහා උපදේශකවරයෙක් වශයෙන් ඔබ විසින් සුසන්තට ලබාදෙන උපදෙස් පහක් (05) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

02. ප්‍රශ්නය

ජීවන් වසර කිහිපයක සිට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම නිසා පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට ඇතුලත්ව කෙටි නේවාසික පුනරුත්ථාපන වැඩසටහන සාර්ථකව නිම කරන ලදී. තවත් දින කිහිපයකින් ඔහු මධ්‍යස්ථානයෙන් සමුගෙන නිවසට යාමට නියමිතය. තමා නිවසට ගිය පසු <u>කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිතා නොකර</u> සතුටින් කාලය ගත කරන බව ඔහු ස්ථිරවම සිය උපදේශකවරයාට ප්‍රකාශ කර ඇත.

i. ජීවන්ගේ උපදේශකවරයා වශයෙන් ඔහුගේ ප්‍රකාශය පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න. අනාගතයේදී ඔහුගේ මත්ද්‍රව්‍ය භාවිතය සහ ඔහුගේ අනෙකුත් ප්‍රගතීන් ආශ්‍රිත තත්වයන් සොයා බැලීම සඳහා කෙටි සැලැස්මක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

ii. බාහිර සේවා නිලධාරියෙකුගේ (out reach worker) කාර්යයභාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

03. ප්‍රශ්නය - කෙටි සටහන් ලියන්න.

i. සුවවීමේ ප්‍රාග්ධනය - (Recovery Capital)

ii. සිද්ධි කළමනාකරණය (Case Management)

iii. බාහිර සේවා සංකල්ප (out reach concepts)

iv. ප්‍රතිකාරාත්මක ප්‍රජාව (Therapeutic Community)

(එක් කොටසකට ලකුණු 05)

04. මත්ද්‍රව්‍ය ප්‍රතිකාර ක්‍රමවේදයන් හඳුන්වා පුනරුත්ථාපන ක්‍රියාවලිය කෙරෙහි ඒවායෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. ප්‍රතිකාර මධ්‍යස්ථානයක පවත්වාගත යුතු අවම ප්‍රමිතීන් පිළිබඳ හැඳින්වීමක් කර පුනරුත්ථාපනයේ සාර්ථකත්වයට එය බලපාන්නේ කෙසේදැයි පහදන්න.

(ලකුණු 20)

06. මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීමේ ක්‍රියාවලියෙහි සංවර්ධනාත්මක අවධි හතර උදාහරණ දෙමින් සාකච්ඡා කර ඇබ්බැහිය පිළිබඳ අර්ථ නිරූපනයක් සපයන්න.

(ලකුණු 20)

07. මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා ප්‍රතිකාරයේදී ඖෂධ සහය කොටගත් ප්‍රතිකාර(Medical Assistant Treatment) සහ චර්යාවාදී චිකිත්සා එක්ව භාවිත කිරීමේ වාසි විමසන්න.

(ලකුණු 20)

08. පුනරුත්ථාපන වර්ග පිළිබඳ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමෙහිලා යෝග්‍ය පුනරුත්ථාපන වැඩපිළිවෙලක් ප්‍රායෝගික උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

*****